# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: ස.සං.දෙ./බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.10.21

**නියාමන උපදෙස් - බැ/ නි/ ඒ/ 2022/ 03**

ජාතික මට්ටමේ සහ දීප ව්‍යාප්ත සමුපකාර සමිති/ සංගම්වල

ගරු සභාපතිවරුන් වෙත,

**සමුපකාර ග්‍රාමීය බැංකු, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, ග්‍රාමීය බැංකු මහා සංගමය, සණස දිස්ත්‍රික් සංගම් සහ සණස මහා සංගමය සහ වෙනත් සියලුම මහජන තැන්පතු භාරගන්නා සමුපකාර මූල්‍ය සේවා සමිති විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැදුම්කර වැනි රාජ්‍ය සුරැකුම්පත් මිලදී ගැනීමේදී පිළිපැදිය යුතු ක්‍රියාපටිපාටි පිළිබඳ උපදෙස් සහ මගපෙන්වීම්**

01. හැඳින්වීම

- භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැදුම්කර යන මූල්‍ය උපකරණයන්හි ආයෝජනය කිරීම පිළිබඳව නිසි උපදෙස් සහ මගපෙන්වීම් නොමැතිකමින් ඇතැම් මූල්‍ය සේවා සමුපකාර සමිති විසින් සිදුකරන ලද අවිධිමත් ආයෝජනයන් හේතුවෙන් තැන්පත්කරුවන්ගේ අරමුදල් දැඩි අවදානමකට ලක් වී ඇති බව නිරීක්ෂණය වේ.
- මෙම උපදෙස් නිකුත් කිරීමේ අරමුණ වන්නේ ඉහත සඳහන් සමුපකාර මූල්‍ය සේවා සමිතිවල මහජන තැන්පත් සුරක්ෂිත වන ආකාරයට, ද්‍රවශීලතාව රැකගනිමින් මෙම මූල්‍ය උපකරණයන්හි සමිති සතු අතිරික්ත අරමුදල් අවදානම් රහිතව ආයෝජනය කරන ආකාරය පැහැදිලි කර දීම සඳහා වේ.

02. භාණ්ඩාගාර බිල්පත්

- අතිශයින් ද්‍රවශීලී, ඉස්තරම් ගණයේ (Gilt-edged) සුරැකුමක් වන මෙය මාස 03 (දින 91), මාස 06 (දින 182) සහ මාස 12 (දින 364) ක පරිණතියකින් යුක්තය.
- භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේදී පොලී අනුපාතයක් නිශ්චිතව සඳහන් නොකෙරෙන අතර මිලදී ගන්නා පාර්ශවය ඉදිරිපත් කරන ගැනුම් මිල සහ බිල්පතේ මුහුණත අගය අතර වෙනස ලෙස සැලකෙන ඵලදායීතාවය මෙහි පොලී අනුපාතය වේ.

03. භාණ්ඩාගාර බැඳුම්කර

- රජය විසින් මධ්‍යකාලීන සහ දිගුකාලීන මුල්‍යකරණයන් සඳහා අරමුදල් සම්පාදන උපකරණයක් ලෙස භාවිතා කරනු ලබන මෙය වසර 03, 05, 08 සහ 10 යන පරිණතියන්ගෙන් යුක්ත වේ.
- භාණ්ඩාගාර බැඳුම්කර සඳහා බැඳුම්කරයට ඇමුණුමක් ලෙස පොළී කූපන් අමුණා ඇත. මේ අනුව අර්ධ වාර්ෂිකව එම කූපනය ඉදිරිපත් කිරීමෙන් ආයෝජකයාට ප්‍රතිලාභ ලාබා ගත හැක.

04. මෙම උපකරණ මිලදී ගැනීමේ යෝජිත ක්‍රමවේදය

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද බලපත්‍රලාභී ප්‍රාථමික අලෙවිකරුවන් හරහා මෙම මුල්‍ය උපකරණවල ආයෝජනය කල හැක.
- මෑතකදී මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද තොරතුරු අනුව පහත දැක්වෙන ප්‍රාථමික අලෙවිකරුවන් මඟින් මිලදී ගැනීම කල හැක.
  - I. ලංකා බැංකුව ( ප්‍රාථමික අලෙවිකරණ ඒකකය), 07 වන මහල, ප්‍රධාන කාර්යාලය, කොළඹ 01
  - II. NSB Fund Management Company Limited, නො.400, ගාලු පාර, කොළඹ 03
  - III. මහජන බැංකුව ( ප්‍රාථමික අලෙවිකරණ ඒකකය), ප්‍රධාන කාර්යාලය, කොළඹ 02
  - IV. සම්පත් බැංකුව ( ප්‍රාථමික අලෙවිකරණ ඒකකය), ප්‍රධාන කාර්යාලය, කොළඹ 02
  - V. සෙලාන් බැංකුව ( ප්‍රාථමික අලෙවිකරණ ඒකකය), ප්‍රධාන කාර්යාලය, කොළඹ 03
  - VI. සී/ස කොමර්ෂල් බැංකුව ( ප්‍රාථමික අලෙවිකරණ ඒකකය), ප්‍රධාන කාර්යාලය, කොළඹ 01
- මෙම බැංකුවලට අමතරව පෞද්ගලික ප්‍රාථමික අලෙවිකරුවන් පස් දෙනෙකු ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති අතර ඉන් එක් අයෙකුගේ බලපත්‍රය 2017.07.24 දින සිට අත්හිටුවා ඇත.
- තවද, පෞද්ගලික අලෙවිකරුවන් මඟින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමේදී අවදානම් තත්වයක් පැවතිය හැකි බැවින් ද එසේ මිල දී ගත් ඇතැම් අවස්ථාවලදී විවිධ සේවා සමුපකාර සමිති ගණනාවක අරමුදල් අවදානමට ලක් වී ඇති අතර ඒවායේ තැන්පත්කරුවන්ගේ වගකීම් වසර ගණනාවක් තිස්සේ ගෙවීමට නොහැකි වී දැඩි අවදානම් සහිත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවී ඇත.
- මේ අනුව ඉහත සඳහන් වාණිජ බැංකු සහ විශේෂිත බැංකුවකට අයත් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය කිරීමට කටයුතු කිරීම ඥානාන්විත වේ.

05. මෙම ආයෝජනයන්හිදී මුහුණ දීමට සිදුවන ප්‍රායෝගික ගැටළු

- බැංකුවලට අයත් ප්‍රාථමික අලෙවිකරුවන් මඟින් මෙම සුරැකුම්පත් ආයෝජනයන් කිරීමට ඉල්ලුම් කල විට ප්‍රාථමික අලෙවිකාර කටයුතු කරන බැංකු කළමනාකරුවන් තම ජංගම සහ ඉතුරුම් ගිණුම්වල ඇති අරමුදල් මෙම ආයෝජනයන්ට මාරුවන විට තම තැන්පත් ඉලක්කයන් අඩු වීම සහ ලාභ ඉලක්කයන් කරා ළඟාවීම ගැටළු සහගත වන හෙයින්

භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජනයන් අධෛර්යමත් කිරීමට උත්සාහ කිරීමේ පරිචයන් නිරීක්ෂණය විය.

- මෙවැනි අවස්ථා වලදී එම ප්‍රාථමික අලෙවිකාර කටයුතු කරන බැංකු වලින් සමිතිවල ඇති වර්තමාන තැන්පතුවලට ද එම රාජ්‍ය සුරැකුම්පත් වලට ගෙවන පොළී අනුපාත ලබා දෙන ලෙස කතිකා කිරීම (Negotiate) කලයුතු අතර, මෙවැනි අවස්ථාවන්ට මුහුණ දීමට හැකිවන පරිදි මූල්‍ය වෙළෙඳපොලේ ප්‍රවණතා පිළිබඳව මනා දැනුවත් බවකින් සිටිමින් විචක්ෂණශීලීව ක්‍රියාකිරීමේ වැදගත්කම අවධාරණය කරමි.

06. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර කල්පිරීමට ප්‍රථම උපලබ්ධි කිරීම.

- පරිණත දිනයට පෙර මෙම මූල්‍ය උපකරණයන් මුදල් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය වූවහොත් සමුපකාර සමිතියේ බැංකුකරුවන් මඟින් වට්ටම් කිරීම කල හැකිය.
- මූල්‍ය උපකරණය වට්ටම් කිරීමේදී වට්ටම් කරන දිනය සහ මූල්‍ය උපකරණයේ පරිණත දිනය අතර වන දින පරතරය සඳහා කිසියම් ප්‍රතිශතයක් අඩු කරන අතර, මෙසේ අඩුකරන ප්‍රතිශතයද බැංකුවට තනිව තීරණය කිරීමට ඉඩ නොතබා, සමිතියේ එම බැංකුවේ ඇති වර්තමාන තැන්පතු ප්‍රමාණය, ගණුදෙනු පරිමාව ආදී සාධක ඉදිරිපත් කරමින් කළමනාකරුවන් සමඟ කතිකා කර අඩුම වට්ටම් අනුපාතිකයකට භාණ්ඩාගාර බිල්පත හෝ බැඳුම්කර මුදල් කිරීමට කටයුතු කල යුතු ය.

07. විශේෂයෙන් සඳහන් කරන කරුණු

- සමුපකාර මූල්‍ය සේවා සමිති සතු අරමුදල් මූලික වශයෙන් සාමාජික ණය සම්පාදනයට උපයෝගි කරගත යුතු අතර, නිශ්චිතව අතිරික්ත අරමුදල් පමණක් මෙවැනි ආයෝජනයන් සඳහා යෙදවිය යුතු ය.
- සමිති විසින් සිදුකරනු ලබන ආයෝජනයන් නිසා මුහුණ දෙන වංචා සහ අක්‍රමිකතා සහ අවිධිමත් පරිචයන් නිසා මහජන තැන්පතු ගෙවීමට නොහැකි වූ ඇතැම් අවස්ථාවල අධිකරණයන් හමුවේ නෛතික ක්‍රියාමාර්ගයන්ට මුහුණදීමට සිදුවනුයේ සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරීන්ට වන හෙයින්, මෙම සියලුම ආයෝජනයන් සිදුකල යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ සමුපකාර සමිතිය භාර දෙපාර්තමේන්තු නිලධාරීවරයාගේ අධීක්ෂණය යටතේ පමණක් බව විශේෂයෙන් අවධාරණය කරමි.

**ජී. ඩී. කීර්ති ගමගේ**
**සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ**
**සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්**

පිටපත්

| | | |
|---|---|---|
| 01. පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්වරුන් | - | කරු.දැ.පි |
| 02. අධ්‍යක්ෂක ජනරාල් (ජාතික සමුපකාර සංවර්ධන ආයතනය) | - | කරු.දැ.පි |
| 03. දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන් | - | කරු.දැ.පි හා අ.ක.ස |
| 04. සමුපකාර සමිති අධීක්ෂණ නිලධාරීන් | - | කරු.දැ.පි හා අ.ක.ස |
| 05. විගණන නිලධාරීන් | - | කරු.දැ.පි හා අ.ක.ස |